චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග III ව්‍යාපෘතිය (අදියර I) - 2018
--------------------------------------------------------------------------------------------------------

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග III ව්‍යාපෘතිය (අදියර I) හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන සංවර්ධන බැංකු සංස්ථාව (සීඩීබී) අතර 2014 මාර්තු 11 දින එළඹි අංක 4510201401100000245 දරන ණය ගිවිසුම සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ රටපුරා ව්‍යාප්තව ඇති ප්‍රමුඛතා පදනම මත තෝරාගත් මාර්ග කොටස් පුනරුත්ථාපනය කිරීම තුළින් රටේ ජාතික මහාමාර්ග ජාලයේ සංචලනය වැඩි දියුණු කිරීම සහ එමඟින් ආර්ථික සංවර්ධන කටයුතු සඳහා දායක වීම සඳහා පහසුකම් සැලසීමයි. ණය ගිවිසුම් වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 357.69 ක් වූ රු. මිලියන 46,184.54 කට සමාන වූ අතර එයින් එ.ජ.ඩො. මිලියන 300 කට සමාන රු. මිලියන 38,736 කට සමාන මුදලක් චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 09 දින ආරම්භ කර තිබුණු අතර 2017 ජූනි 17 දින වන විට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2019 පෙබරවාරි 19 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදනයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරනනේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ ව්‍යාපෘතිය නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මහනුවර-යාපනය මාර්ගයේ වැඩබිම නියමිත වේලාවට ලබා නොදීම නිසා කොන්ත්‍රාත්කරු රු. මිලියන 119 ක වන්දියක් ඉල්ලා තිබුණු අතර එම මුදලින් රු. මිලියන 94 ක් ආරවුල් විනිශ්චය මණ්ඩලය විසින් ගෙවීමට තීරණය කර තිබුණද එම වන්දිය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන කිසිවක් සිදු කර නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | ආ.වි.ම. තීරණය පාර්ශවයන්ගේ පාලනයෙන් බැහැර වන අතර තීරණය ලබා දෙන තුරු, ගෙවිය යුතු මුදල තීරණය කළ නොහැක. එබැවින් වන්දි මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 05/2016 සහ මුදල් රෙගුලාසි අංක. 756. | තොග සත්‍යාපනය සිදු කර නොතිබුණු අතර සත්‍යාපන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල වීම. | මින් ඉදිරියට තොග සත්‍යාපනය 2016 මාර්තු 31 දිනැති 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව සිදු කරණු ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 සැප්තැම්බර් 30 දින වන විට මාර්ග 12 ක කි.මී. 248.34 ක හා අමතර වැඩ යටතේ අනෙකුත් මාර්ග 04 ක කි.මී 16 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබුණි. මේ අතර, අමතර වැඩ යටතේ මාර්ග 05 ක කි.මී. 22.65 ක ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකෙරෙමින් පැවතුණි. | ව්‍යාපෘතිය මඟින් අනවශ්‍ය වියදම් දැරීමට ඇති හැකියාව. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අදාළ අනුමැතිය ලබා නොගෙන, ව්‍යාපෘතියේ විෂය පථයෙන් බැහැර වූ මහනුවර කිරිමැටිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2014 වර්ෂයේදී නිම කර තිබුණු අතර රු. මිලියන 11.32 ක ගෙවීමක් 2016 ජූලි 18 දින සිදු කර තිබුණි. | අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව. | ප්‍රසම්පාදන අත්පොතෙහි අතිරේක 14 ට අනුව සහ කොන්ත්‍රාත්තුවේ FIDIC කොන්දේසි වලට අනුකූලව, ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයාට අනුමත කිරීමේ බලය තිබියදීත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගෙවීම අනුමත කර තිබුණු අතර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නොවනු ඇත. | අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව කාර්ය සාධන ඇපකරය කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ වියදමින් ලබා ගැනීම අවශ්‍ය වුවද, එය ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ලෙස ඇතුළත් කිරීමෙන්, මාරවිල උඩුබද්දාව පාරේ කොන්ත්‍රාත්කරුට රු. මිලියන 31 ක අයුතු ප්‍රතිලාභයක් අත්කර දී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අයුතු ප්‍රතිලාභ අත්වීම. | එසේ නොමැති වුවහොත්, කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන ඇපකරයේ පිරිවැය වෙනත් ගෙවීම් අයිතමයක් සඳහා එකතු කිරීමෙන් රේටයන්ගේ ඉහළයාමක් සිදුවනු ඇත. එබැවින්, ප්‍රමාණ පත්‍රවල ගෙවීම් අයිතම 108.1 (1) හි පවතින ප්‍රතිපාදන යටතේ ගෙවීම අවිධිමත් ගෙවීමක් නොවනු ඇත. | වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලබාදුන් තොරතුරුවලට අනුව, මාවනැල්ල - හෙම්මාතගම - ගම්පොල පාරේ 23+850 සිට 23+855 දක්වා වූ කොටසෙහි කාපට් මතුපිට ඉරිතැලීම් දෙකක් හඳුනාගෙන තිබුණි. අඩුපාඩු පිළිබඳ දැනුම්දීම් 2019 සැප්තැම්බර් 05 දින නිකුත් කර තිබුණද, 2019 දෙසැම්බර් 25 දින දක්වා කිසිදු නිවැරදි කිරීමේ පියවරක් ගෙන නොතිබුණි. | මාර්ග ඉදිකිරීම් වල කල්පැවැත්මට සෘජුවම බලපානු ඇත. | පසුගිය මාස කිහිපය තුළ පැවති අධික වැසි සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන්, නිවැරදි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. 2020 ජනවාරි මස මුලදී නිවැරදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු කටයුතු කර තිබුණි. | ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කර නිවැරදි කළ යුතුය. |